

# සරණ සොයා මියයන්නෝ

ධනවත්, ඉසුරු පිරි රටවලට සරණ සොයා සංක්‍රමණය වන පිරිස අද වන විට බොහෝ ඉහළගොස් ඇති බව අපට දැනෙන්නේ අප ද එවැනි රටක ජීවත්වන නිසා ය. -සරණාගතයා" ලෙස හඳුන්වන මෙවැනි සරණ සොයා යන මිනිසුන් රොත්තක් මෑතකදී -ක්‍රිස්මස්ට් අයිලන්ඩ්" අසළ මුහුදේදී දියබත් වූ අයුරු මාධ්‍ය තුළින් ඔබ සැම නරඹන්නට හෝ කියවන්නට හෝ අසන්නට ඇතැයි මම විශ්වාස කරමි. 2004 සුනාමිය දුටු ඔබ සැමට එම දසුන සුළු දසුනක් වුවත්, එයින් විනාශ වූ ජීවිත ගණන සුනාමියේ විපත අනුව දශමයක් තරම් වුවත්, ඒ තුළින් අනාගතයේදී ඇතිවිය හැකි අසුබ පෙරනිමිති අපට මැනවින් කියාපායි.

බොහෝ ධනවත් රටවල වැසියන් බොහෝමයක් එම රටවලට ගොඩ බැස ඇත්තේ සරණාගතයින් නොහොත් අනාථයින් ලෙසිනි. මෙරට වාසී බොහෝමයක් මුළින්ම මෙරටට ගොඩ බැස ඇත්තේ සරණාගතයන් ලෙසින් නොව සිරකරුවන් ලෙසිනි. පරම්පරාවෙන් පරම්පරාවට මෙරටට උරුමකම් කියන ඔවුන් අද අනාථයින්ට නාථ වන දෙවිවරුන් බවට පත්ව ඇත. කැනඩාව, ඕස්ට්‍රේලියාව, නවසීලන්තය වැනි රටවල සත්‍ය තත්වය විකෘති කරන තැරැව් කරුවන්ට ද -සරණාගතයා" යන වදන ධන උල්පතක් වී ඇත.

දරිද්‍රතාව සහ යුධ බිය පිරි රටවල වෙසෙන ජනයා තම සේසතම තැරැව් කරුවන්ට පුදා යහපත් හෙට දවසක් සොයා ජීවිතයට විශාල අවදානමක් ගෙන මුහුදු රළ මැදින් ගමන් කරන්නේ මනුෂ්‍ය ආත්මයක් ලද මේ පොළොව තුළ මැරෙන තුරා සැපවත් සාමවත් ජීවිතයක් ගත කරන්නටය. එහෙත් මහ දියඹ මැදින් අවදානම් ගමනක් වන මේ ගමන එන මිනිසුන් ඇත්තෙන්ම සරණාගතයා යන වදනෙහි නිසි තේරුම නොදන්නවා හෝ නැත්තම් දැන දැනම තැරැව් කරුවන්ගේ වහසි බස් වලට රැවටෙනවා විය හැකි ය.

ශ්‍රී ලංකාවෙන්, යුරෝපීය රටවලට සහ ඕස්ට්‍රේලියාවට සංක්‍රමණය වූ බොහෝ පිරිසෙන් වැඩි කොටසක් සරණාගතයින් ලෙස ගොඩ බැසගත් අයයි. 89 යේ භීෂණ සමයේ හා වසර 30 ක් පුරාවට පැවති ජනවාර්ගික යුද්ධය හරහා මෙම වාසිය ලබාගත් බොහෝ පිරිසක් ඇත්තෙන්ම සරණාගතයින් නොවේ. සරණාගතයින් මුවාවෙන් අප රටේ එදා පැවති දේශපාලන හා සමාජ වාතාවරණය ප්‍රයෝජනයට ගෙන පැමිණි බොහෝ පිරිසක් යහපත් ආර්ථික පසුබිමක් තිබූ පිරිසය. මා දන්නා පරිදිම අප ගමේ සිටි ඉඩකඩම් වතුපිටි හිමි තරුණයෙකු මෙරටට පැමිණියේ සරණාගතයෙකු ලෙසිනි. ඇත්ත වශයෙන්ම ඔහු එදා ප්‍රබල එජාප ආධාරකරුවෙකි. එහෙත් භීෂණ සමයේ ඔහුට කිසිදු පක්ෂයකින් හෝ කිසිවෙකුගෙන් ජීවිත/මරණ තර්ජනයක් පවා තිබුණේ නැත. රාජ්‍ය ත්‍රස්තවාදය හා අනෙකුත් සංවිධාන වල භීෂණයට මුහුණදී මරු වැළඳ ගන්නා කාලය තුළදී ඒ මුවාවෙන් ධනවත් රටවල් වල හවිහරණය ලැබුවේ වෙනත් පිරිස්ය.

ද්‍රවිඩ සරණාගතයින් ලෙස එදා පැමිණි බොහෝ පිරිස් අද එම රටවල නිත්‍ය පදිංචි කරුවන් ය. ඔවුන්ගෙන් ලැබුණු ආධාර උපකාර බොහෝමයක් එල්ටීටීයට ලැබුණේ අප රට විනාශ කිරීමටය. එහෙත් නිත්‍ය වීසා නොලැබුණු බොහෝ පිරිසක් යුද්ධය අවසන් වනවාට එතරම් කැමැත්තක් තිබුණේ නැත. එම යුද්ධය දිගමට පැවතීම නිත්‍ය වීසා ලබාගැනීමට වාසි සහගත වන නිසාය. ද්‍රවිඩ උගතුන්ගෙන් 85% ක් පමණ වෙසෙන්නේ මෙම රටවලට. මේ සියල්ලම යුද්ධයට කැමති පිරිස් නොවේ. එහෙත් ඔවුන්ට එදා එල්ටීටීඊ යේ තිබූ බලපෑම් මත ඔවුහු වෙනම රටකට ආදරය කළෝය.

මෑතකදී ඔක්ස්පර්ඩ් දේශනයකට ගිය ජනාධිපති මහින්ද රාජපක්ෂ ට මුහුණ දෙන්නට සිදුවුයේ මෙවැනි සරණාගතයින් ගේ විරෝධයකටය. ඔවුන් හිත යටින් ප්‍රභාකරන්ටත්, ප්‍රේමදාසටත්, ජේ. ආර් ජයවර්ධන වැනි මහත්වරුන්ට පිං දෙමින් මෙවැනි උද්ඝෝෂණ වල නිරත වෙන්නේ මෙවැනි රටවල් වල යහපත් ජිවිතයක් ගත කිරිමට පාර කැපු




ලක්ෂ්මන් කොඩිතුවක්කු

දෙවිවරුන් බවට ඔවුන් පත් කරමිනි. එසේම අනෙක් පසින් ඔවුන් මහින්ද රාජපක්ෂ මහතාට පිං දෙන්නේ මේ යුද්ධය අවසන් කළ නිසාය. බොහෝ උගත් ද්‍රවිඩ පිරිස් මේ යුද්ධය අවසන් වීම ගැන යටි සිතින් සතුටු වන බව මම පෞද්ගලිකවම දනිමි. එයට හේතුව තවමත් සරණාගතයින් ලෙස ජිවත් වෙමින් එල්ටීටීයට ආධාර උපකාර කරන වැඩි උගත් කමක් නැති තරුණ පිරිස් වලින් ඔවුන්ට වන බලපෑම දැන් අවම නිසාය. අතරින් පතර උද්ඝෝෂණයක් පෝස්ටර් ගැහිල්ලක් ඇරෙන්නට වෙනදා තරම් දඟලමින් ආධාර එක්රැස් කිරීමට දැන් එල්ටීටීයට අනුබද්ධ දෙමළ සංවිධාන වලට ඉඩක් නැත. එහෙයින් සාමකාමී දිවිපෙවතකට කැමති දෙමළ පිරිස් මේවායින් ක්‍රමයෙන් ඈත්වෙමින් සිටී. එදා ඔක්ස්පර්ඩ් දේශනයට ගිය මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයාට එරට වෙසෙන සියලුම දෙමළ ජනයා විරුද්ධව පාරට බැස්සා නම් අඩුම තරමින් විසි තිස් දාහක් වෙනු ඇත. එදා එයට සහභාගි වූ පිරිස සුළුතරයකි.

බටහිර රටවල වෙසෙන එම සුළුතර පිරිස කොතෙක් දැඟලුවත් නැවතත් අප රට තුළ වෙනම දෙමළ නිජ බිමකට උරුමකම් කීම ඔවුනට ලෙහෙසි පහසු කාර්යයක් නොවේ. ඉන්දියාවේ බලපෑම් තිබෙන තුරු ඔවුනට දෙමළ නිජ බිමක් ලබාගත නොහැකි ය. එහෙයින් බටහිර රටවල් සමඟ ඇති නොහොඳ නෝක්කාඩු හා හොඳ හිත පළුදු කරගැනීම අවම කර ගැනීමට වත්මන් රජය තවදුරටත් වෙහෙසිය යුතුය. මහින්ද රජය ඇතුළු එයට පක්ෂව ඇති දේශප්‍රේමී බලවේග කෙතරම් ආඩපාලි කීවද, යුධ අපරාධ සම්බන්ධයෙන් බෑන් කී මුන් පනවා ඇති කමිටුවට ශ්‍රී ලංකාව පැමිණීමට ඉඩදීමට රජය තීරණය කළේ ඉදිරියේදී ජාත්‍යයන්තරව මුහුණ දීමට ඇති ප්‍රශ්න අවම කරගැනීමට ලැබෙන ආධාර උපරිමය කරගැනීමට බව ඕනෑම ජගතෙකුට තේරුම් යනු ඇත.

එදා මහින්දට යුද්ධය වෙනුවෙන් තම දේශපාලන චරිතය හා ප්‍රතිපත්ති බිලිඳුන් කරු ජයසුරියට, රජයේ පිරිස් එළවා එළවා පහර ගැසුවද, කරු ජයසුරිය කිව්වෙත්, යුධ අපරාධ නොවී ඇති බවට අපි ජාත්‍යන්තරයට ඒත්තු ගැන්විය යුතු බවයි.

එහෙයින් පමාවී හෝ බෑන් කී මුන් ගේ විද්වත් මණ්ඩලයට පැමිණීමට ඉඩදීම බුද්ධිමත් තීරණයකි. ඉදිරියේදී මේ විද්වත් මණ්ඩලය හමුවේ ලංකාව අනිවාර්යයෙන්ම නිදොස් වෙනු ඇත.

එසේම ලංකාවට මෙපිරිස් ඇඟිලි ගසන්නේ අපි තවමත් ඔවුන්ගේ ආධාර උපකාර ලබන තුන්වන ලෝකයේ රටක් නිසාය. ඔවුන්ගේ ආධාර නොමැතිව අපට තනිවම ගොඩ ඒමට නොහැකි ය. ඇමරිකාව වැනි රටවල් මානව හිමිකම් ගෙඩි පිටින් උල්ලංඝනය කළ ද, ඇමරිකාව ඇතුළු ප්‍රබල රටවල් මෙහෙයවන එක්සත් ජාතීන්ගේ සංවිධාන වලට එයට නිහඬ වනවා ඇරෙන්නට වෙන කිසිවක් කළ නොහැකි ය.

තවදුරටත් ශ්‍රී ලංකාව සරණාගතයින් බිහි කරන රටක් නොවන බව එක්සත් ජාතීන්ගේ සරණාගතයින් පිළිබඳ කොමසාරිස් කාර්යාල නිල වශයෙන් නිවේදනය කිරීම අපරට ලැබූ එක්තරා ජයග්‍රහණයකි. එනිසා සරණාගතයින් මුවාවෙන් ඕස්ට්‍රේලියාව කැනඩාව වැනි රටවලට ඇතුළුවන්නට දඟලන සරණාගතයින් ලෙස පැමිණෙන සිංහල දෙමළ හෝ මුස්ලිම් පිරිස් වලට ඒ පිළිබඳව, තවදුරටත් සිතීමට හා සරණාගතයා යන වදනෙහි නිසි අර්ථයද තේරුම් ගැනීමට ද සිදුවනු ඇත.

බොහෝ අයථා මාර්ගවලින් මෙරටට පැමිණෙන සරණාගතයින් පසු කලෙක ස්ථිර වීසා ලබාගෙන ස්ථිර පදිංචි කරුවන් වූ පසු සරණාගතයා යන වචනයට අකමැතිය. එය සාමාන්‍ය මනුෂ්‍ය ස්වභාවයයි. ඔවුන් තබා මීට වසර සියයකට පමණ පෙර පැමිණි යුරෝපීයයෝ ද ඔවුන් පැමිණි අයුරු හා අතීතය කීමට මැලිකමක් දක්වති.

මෙරටවලද දැන් ක්‍රමයෙන් රැකී රක්ෂා ප්‍රශ්න ජීවන වියදම් දිනෙන් දින ඉහළ යයි. ගෙවල් කුලී ඉහළ යන්නේ ලැබෙන වැටුපටත් වඩා උසිනි. එහෙයින් ඔවුන්ටද දැන් සරණාගතයා යන වදන තිත්ත වී ඇත. තමන් රජයට ගෙවන ආදායම් බදුවලින් වෙනත් පිරිස් නොමිළේ කකා බිබී විනෝදවීම දකින ඔවුන්ට ද සරණාගතයින් පිළිබඳව මීට වඩා දැඩි ලෙස තීරණ ගැනීමට සිදුවනු ඇත. ආසියානු රටවල මෙන් තමන්ගේ ප්‍රාන්තවල වෙසෙන සුළු ජාතීන්ගේ ඡන්ද වාසිය තකා නියම සරණාගතයා කවුරුන්ද යන්න තෝරාගැනීමට ගිලාඩ් රජයටද නොහැකි වුවහොත් එක ආසනයකින් වැනෙන ප්‍රථම ඕස්ට්‍රේලියානු අගමැති වරියටද සිදුවන්නේ නිසි කලට පෙර විපක්ෂයට යන්නටය. එහෙයින් අනාථයින්ට නාථ වීම පිං සිද්ද වෙන කාර්යයක් වුවත් වත්මන් ලෝක ආර්ථික, දේශපාලන හා යුධ අර්බුද හමුවේ පාලකයින් අනාථ වෙන කරුණක් වෙනු ඇත. පෙරදා, පැමිණෙන සරණාගතයින් වෙනුවෙන් දෙවරක් නොහිතා එක හිතින් සරණ වූ ගිලාඩ් රජය දැන් තැරැව් කරුවන්ට දොස් නඟමින් ඔවුන් නීතිය හමුවට පැමිණිවිය යුතු බවට දෙස් දෙවොල් තබන්නේ පෝලිමේ මහ මුහුදේ දියඹ මැදින් ඇදෙන බෝට්ටුවල පිරිස් එන්න එන්නම ඉහළ යන නිසාය. ඒ නිසා වත්මන් ලෝක දේශපාලන රටක් තුළ සරණාගතයා සේම පාලකයින්ද සරණාගතයින් බවට පත්වන කාලය වැඩි ඈතක නොවේ.

